මගේ අංකය: CSD/03/03/14.  චක්‍රලේඛ අංක - 9/2015

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව,
අංක 23, දුම්රියපොල පාර,
බම්බලපිටිය.
2015-11-05

අතිරේක අධ්‍යක්ෂ ජනරාල්,
සියලුම අධ්‍යක්ෂවරුන්/නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්/සහකාර අධ්‍යක්ෂවරුන්,
සියලුම අංශභාර නිළධාරීන්,
සියලුම බලකා අණදෙන නිලධාරීන්/පුහුණු කඳවුරුභාර අණදෙන නිලධාරීන්,
හා ව්‍යාපෘතිභාර නිලධාරීන් වෙත,

**දෛනික/සති අන්ත පුවත්පත් මිලදීගැනීම.**

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ එක් එක් තනතුරු වලට අදාලව පුවත්පත් මිලදීගැනීම පහත පරිදි සිදුකල යුතුය.

| අනු අංකය | නිලධාරී කාණ්ඩය | ලබාගත හැකි පුවත්පත් ප්‍රමාණය | |
|---|---|---|---|
| | | දෛනික | සති අන්ත |
| 01 | අධ්‍යක්ෂ ජනරාල් | 04 | 04 |
| 02 | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | 03 | 02 |
| 03 | සියලුම අධ්‍යක්ෂකවරු | 02 | 01 |
| 04 | බලකා/පුහුණු කඳවුරු භාර අණදෙන නිලධාරීන් | 02 | 01 |

02) මෙම සියලු පුවත්පත් මිලදීගැනීම් අංක MOD/CIS/APM/NSE/12 හා 2013/12/27 දිනැති ලිපියෙහි සඳහන් පරිදි ආරක්ෂක අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියට යටත්ව සිදුකල යුතුය. එහි සඳහන් කර ඇති පරිදි මාධ්‍ය අංශයට පමණක් එයින් අනුමත කර ඇති සියලුම පුවත්පත් මිලදීගැනීම ඉදිරියටත් සිදුකල හැක.

03) මේ සම්බන්ධව 1998-08-14 දිනැති අංක 361 දරණ රාජ්‍ය මුදල් චක්‍ර ලේඛය අනුව පුවත්පත් මිලදීගනු ලබන නිළධාරියා විසින් තමා මිලදී ගනු ලබන පුවත්පත් වෙනුවෙන් දැනට ගෙවීම් කරනු ලබන 10% වටිනාකම 15% ලෙස සංශෝධනය විය යුතුය. එම සංශෝධනයන්ට යටත්ව පුවත්පත් මිලදීගැනීමට අදහස් කරන්නේ නම් අදාල මුදල් ඔබ විසින් අධ්‍යක්ෂ ජනරාල්, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව නමින් ලංකා බැංකුවේ බම්බලපිටිය ශාඛාවේ පවත්වාගෙන යනු ලබන අංක7042755 දරණ ගිණුමට බැරකොට එම කුවිතාන්සිය බිල්පත සමඟ නිරවුල් කිරීම සඳහා අදාල අංශය වෙත එවිය යුතුය.

04) පුවත්පත් මිලදී ගැනීම සඳහා හිමිකම් නොලබන දෙපාර්තමේන්තු මූලස්ථානයේ සියලුම නිළධාරීන් වෙනුවෙන් පුවත්පත් කියවීමේ පහසුකම් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු මූලස්ථාන උද්‍යාන ශාලාවේ උදේ 8.00 - සවස 4.00 දක්වා සපයා ඇති අතර එය තම රාජකාරියට බාධාවක් නොවන අයුරින් සිදු කිරීම සියල්ලන්ගේම වගකීමක් වනු ඇත. උක්ත චක්‍රලේඛය අනුව පුවත්පත් අපහරණ කිරීමේදී ද පොදු කියවීම් ශාලාවේ ඇති පුවත්පත් ලබාගැනීමට ඕනෑම අයකුට හැකියාව ඇති අතර අදාල පුවත්පතේ වෙළඳපල වටිනාකමින් 10%ක් ගෙවා ප්‍රසම්පාදන අංශයෙන් ලබාගත හැක.

05) මේ සම්බන්ධයෙන් 2009-10-26 දාතමින් නිකුත් කරන ලද අංක 2009/24 දරණ චක්‍ර ලේඛය මෙයින් අවලංගු කරන අතර මෙම චක්‍රලේඛය 2015-01-01 දින සිට ක්‍රියාත්මක වන බව මෙයින් දන්වනු ලැබේ.

චන්ද්‍රරත්න පල්ලේගම
අධ්‍යක්ෂ ජනරාල්.

ඇමුණුම - 01

MOD/CIS/APM/NSE/12

සි.ආ.දෙ/ආ/02/විවිධ

2013.12. 23

අධ්‍යක්ෂ ජනරාල්
සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව.

<u>පුවත්පත් මිලදී ගැනීම.</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබගේ ඉහත සමාංක දරණ 2013.10.31 දිනැති ලිපිය හා බැදේ.

එම ලිපියට අනුව අදාල ඇමුණුම I හා II හි සඳහන් පුවත්පත් මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබා දෙමි.

ඩී.එම්.එස්. දිසානායක
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් ( සිවිල් ආරක්ෂක හා සංවර්ධන)
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන
අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට.

# පුවත් පත් මිළ දී ගැනීම
# සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු මූලස්ථානය

| | අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය | අධ්‍යක්ෂ (මුදල්) කාර්යාලය | අධ්‍යක්ෂ (මෙහෙයුම්) කාර්යාලය | අධ්‍යක්ෂ (ව්‍යාපෘති) කාර්යාලය | අධ්‍යක්ෂ (පුහුණු) කාර්යාලය | අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන) කාර්යාලය | අධ්‍යක්ෂ (සුබ සාධන) කාර්යාලය | සහකාර අධ්‍යක්ෂ (පාලන) කාර්යාලය | සහකාර අධ්‍යක්ෂ (ගිණුම් හා ගෙවීම්) කාර්. | සහකාර අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන) කාර්. | අධ්‍යක්ෂ ජනරාල්ගේ ලේකම් කාර්යාලය | මූලස්ථාන පොලිස් පරීක්ෂක කාර්යාලය | ස්ථානාධිපති (පාලන) කාර්යාලය | වැ බ වැටුප් අධ්‍යක්ෂක කාර්යාලය | අධ්‍යක්ෂ (පිරිස් පාලන) කාර්යාලය | ස්ථානාධිපති (සහසාධක) කාර්යාලය | දත්ත සංචිතය භාර නිළධාරී කාර්යාලය | ආරක්ෂාව භාර නිළධාරී කාර්යාලය | ස්ථානාධිපති (ප්‍රවාහන) කාර්යාලය | මාධ්‍ය අංශය කාර්යාලය | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **දිනපතා පුවත්පත්** | | | | | | | | | | | | | | | | | | | | | | |
| දිනමිණ | ✓ | | | | | | | | ✓ | | | | ✓ | | | | ✓ | | | | ✓ | 5 |
| දිවයින | ✓ | ✓ | ✓ | | | | | ✓ | | | | | | | ✓ | | | | | | ✓ | 6 |
| ලංකාදීප | ✓ | | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | | | ✓ | ✓ | ✓ | ✓ | ✓ | | | ✓ | ✓ | ✓ | ✓ | 16 |
| ලක්බිම | | | | | | | | ✓ | | ✓ | | | | | | | | | | | ✓ | 3 |
| මව්බිම | | | | | | | | | | | | | | | | | | | | | ✓ | 1 |
| රිවිර | | | | | | | | ✓ | | | | | | | | | | | | | ✓ | 2 |
| අද | | | | | | | | | | | | | | | | | | | | | ✓ | 1 |
| ඩේලි නිවුස් | ✓ | ✓ | ✓ | | ✓ | | | | | | | ✓ | | | | | | | | | ✓ | 6 |
| දි අයිලන්ඩ් | ✓ | | | ✓ | | ✓ | ✓ | | | | | | ✓ | | | | | | | | ✓ | 6 |
| ඩේලි මිරර් | ✓ | | | | | | | | | | | | | | | | | | | | ✓ | 2 |
| ටුඩේ | | | | | | | | | | | | | | | | | | | | | ✓ | 1 |
| තිනකරන් | | | | | | | | | | | | | | | | | | | | | ✓ | 1 |
| සිලෝන් ටුඩේ | | | | | | | | | | | | | | | | | | | | | ✓ | 1 |
| | | | | | | | | | | | | | | | | | | | | | | |
| **එකතුව** | 6 | 2 | 3 | 2 | 2 | 2 | 2 | 4 | 1 | 1 | 1 | 2 | 3 | 1 | 2 | 0 | 1 | 1 | 1 | 1 | 13 | 51 |
| | | | | | | | | | | | | | | | | | | | | | | |
| **සති අන්ත(ඉරිදා) පුවත් පත්** | | | | | | | | | | | | | | | | | | | | | | |
| ලංකාදීප | ✓ | | | ✓ | ✓ | ✓ | ✓ | | | | | | ✓ | ✓ | ✓ | ✓ | | | ✓ | | ✓ | 11 |
| දිවයින | ✓ | ✓ | | | | | | ✓ | | | | | | | | | | | | | ✓ | 4 |
| ලක්බිම | ✓ | | | | | | | ✓ | | | | ✓ | | | | | | | | | ✓ | 4 |
| සිළුමිණ | | | | | | | | | | | | | | | | | ✓ | | | | ✓ | 2 |
| රිවිර | ✓ | | | | | | | ✓ | | | | ✓ | | | | ✓ | | | | | ✓ | 5 |
| මව්බිම | | | | | | | | | | | | | | | | | | | | | ✓ | 1 |
| ඉරුදින | | | | | | | | | | | | | | | | | | | | | ✓ | 1 |
| රන්දිව | | | | | | | | | | | | | | | | | | | | | ✓ | 1 |
| සන්ඩේ ලීඩර් | ✓ | | | | | | | | | | | | | | | | | | | | ✓ | 2 |
| සන්ඩේ ටයිම්ස් | ✓ | ✓ | | ✓ | ✓ | ✓ | | | | | | | | | ✓ | ✓ | | | | | ✓ | 8 |
| සන්ඩේ ඔබ්සර්වර් | ✓ | ✓ | ✓ | | | | | | ✓ | ✓ | ✓ | | | | | | ✓ | | | | | 7 |
| සන්ඩේ අයිලන්ඩ් | | | | | | | | | | | | | | | | | | | | | ✓ | 1 |
| සිලෝන් ටුඩේ | | | | | | | | | | | | | | | | | | | | | ✓ | 1 |
| | | | | | | | | | | | | | | | | | | | | | | |
| **එකතුව** | 7 | 3 | 1 | 2 | 2 | 2 | 1 | 3 | 1 | 1 | 1 | 2 | 1 | 1 | 2 | 3 | 2 | 0 | 1 | 0 | 12 | 48 |

# පුවත් පත් මිළ දී ගැනීම
## සිවිල් ආරක්ෂක බලකා මූලස්ථාන සහ පුහුණු කඳවුරු

| | පොළොන්නරුව බලකාය | මැදිරිගිරිය උප බලකාය | වවුනියා බලකාය | වැලිසර උප බලකාය | මොරවැව/ගෝමරන්කඩවල බලකාය | මැදවච්චිය බලකාය | කැබිතිගොල්ලෑව බලකාය | මිහින්තලේ පුහුණු පාසල | පුත්තලම බලකාය | මහනුවර බලකාය | ත්‍රිකුණාමලය/කන්තලේ බලකාය | විල්පත්තුව බලකාය | වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය-වීරගොඩ | කල්පිටිය පුහුණු කඳවුර | ගල්කිරියාගම උසස් පුහුණු පාසල | උහන බලකා මූලස්ථානය | පහළ ලන්ද පුහුණු කඳවුර | වෙන්නවත්ත බලකාය | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **දිනපතා පුවත්පත්** | | | | | | | | | | | | | | | | | | | |
| දිනමිණ | ✓ | ✓ | ✓ | ✓ | | | ✓ | ✓ | | | ✓ | | ✓ | ✓ | ✓ | ✓ | | ✓ | 12 |
| දිවයින | | | | | | | | | | | | | | | | | | | |
| ලංකාදීප | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | 18 |
| ලක්බිම | | | | | | | | | | | | | | | | | | | |
| මව්බිම | | | | | | | | | | | | | | | | | | | |
| රිවිර | | | | | | | | | | | | | | | | | | | |
| අද | | | | | | | | | | | | | | | | | | | |
| ඩේලි නිවුස් | ✓ | | | | | | | | | | | | | | ✓ | | | ✓ | 3 |
| දි අයිලන්ඩ් | | | | | | | | | | | | | | | | | | | |
| ඩේලි මිරර් | | | | | | | | | | | | | | | | | | | |
| ටුඩේ | | | | | | | | | | | | | | | | | | | |
| තිනකරන් | | | | | | | | | | | | | | | | | | | |
| සිලෝන් ටුඩේ | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | |
| **එකතුව** | 3 | 2 | 2 | 2 | 1 | 1 | 2 | 2 | 1 | 1 | 2 | 1 | 2 | 2 | 3 | 2 | 1 | 3 | 33 |
| | | | | | | | | | | | | | | | | | | | |
| **සති අන්ත (ඉරිදා) පුවත් පත්** | | | | | | | | | | | | | | | | | | | |
| ලංකාදීප | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | 18 |
| දිවයින | | | | | | | | | | | | | | | | | | | |
| ලක්බිම | | | | | | | | | | | | | | | | | | | |
| සිළුමිණ | ✓ | ✓ | ✓ | ✓ | | | ✓ | ✓ | | | ✓ | | ✓ | ✓ | ✓ | ✓ | | ✓ | 12 |
| රිවිර | | | | | | | | | | | | | | | | | | | |
| මව්බිම | | | | | | | | | | | | | | | | | | | |
| ඉරුදින | | | | | | | | | | | | | | | | | | | |
| රන්දිව | | | | | | | | | | | | | | | | | | | |
| සන්ඩේ ලීඩර් | | | | | | | | | | | | | | | | | | | |
| සන්ඩේ ටයිම්ස් | | | | | | | | | | | | | | | | | | | |
| සන්ඩේ ඔබ්සර්වර් | ✓ | | | | ✓ | | ✓ | | | | ✓ | | | | ✓ | ✓ | | ✓ | 7 |
| සන්ඩේ අයිලන්ඩ් | | | | | | | | | | | | | | | | | | | |
| සිලෝන් ටුඩේ | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | |
| **එකතුව** | 3 | 2 | 2 | 2 | 2 | 1 | 3 | 2 | 1 | 1 | 3 | 1 | 2 | 2 | 3 | 3 | 1 | 3 | 37 |

ඇමුණුම - 02

Attention:
Madam, Anoma Wijesooriya

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 361.

25 - 8 - 1998

මගේ අංකය: රා. මු. ශි. කු/07.
රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව,
මහා භාණ්ඩාගාරය,
කොළඹ 01.
1998-08-14

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දිස්ත්‍රික් ලේකම්වරුන් සහ
ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.

19 - 8 - 1998

## පැරණි පුවත්පත් අපහරණය කිරීම

පැරණි පුවත්පත් අපහරණය කිරීම සම්බන්ධයෙන් දැනට අනුගමනය කරනු ලබන ක්‍රියාපටිපාටිය අනාර්ථික සහ කරදරකාරී එකක් බැව් නිරීක්ෂණය වී ඇත. එම ක්‍රියාපටිපාටිය පිරිවැයුම් දායක හා ලිහිල් ක්‍රියා පිළිවෙතක් බවට පත් කිරීමේ අරමුණින් රජයේ අරමුදල් වලින් පුවත්පත් මිලදී ගනු ලබන නිලධාරීන්ගෙන් එකී පුවත්පත්වල වටිනාකමින් 15% ක නාමික අගයක් අය කිරීමට තීරණය කර ඇත. දෙපාර්තමේන්තු වෙනුවෙන් පොදුවේ මිලදී ගනු ලබන පුවත්පත් සම්බන්ධයෙන් ද, මෙම ක්‍රියාපටිපාටිය අනුගමනය කළ හැකි අතර, පුවත්පත් මිලදී ගැනීමට හිමි නිලධාරීන්ගෙන් එම පුවත්පත් වටිනාකමින් 10% ක නාමික අගයක් අය කළ යුතු වේ. අවශ්‍ය නම් මෙම පුවත්පත් අලෙවිය නිලධාරීන් අතර වාරුවෙන් වාරුවට ද, සිදු කළ හැකිය.

මෙමගින් පැරණි පුවත්පත් ගබඩා කිරීම සඳහා ආපසු ඇවිම, ලේඛනගත කිරීම සහ ටෙන්ඩර් පිළිවෙත් මගින් අපහරණය කිරීමට සිදුවීම ද වැළැක්වෙනු ඇත.

මෙම ක්‍රියාපටිපාටිය 1998 සැප්තැම්බර් 01 දින සිට ක්‍රියාත්මක විය යුතුය.

[illegible] වීර
භාණ්ඩාගාරයේ ලේකම්.

මගේ අංක : සිආදෙ/ආ/01 වෙළුම (II) චක්‍රලේඛ අංක : 2009/24

138

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව,
දුම්රියපොල පාර,
බම්බලපිටිය.
2009.10. 26

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ
සියළුම පලාත් භාර නිලධාරීන්, /පුහුණු කඳවුරු භාර නිලධාරීන් වෙත

## දිනපතා පුවත්පත් මිලදී ගැනීම

2009.11.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඔබ පලාත් කාර්යාලය /පුහුණු කඳවුර සඳහා පහත සඳහන් පරිදි දිනපතා පුවත්පත් මිලදී ගැනීමට මෙයින් අනුමැතිය දෙනු ලැබේ.

| පුවත්පතේ නම | ප්‍රමාණය |
|---|---|
| 01. දිනමිණ/සිළුමිණ | 01 බැගින් |
| 02. ලංකාදීප/ඉරිද ලංකාදීප | 01 බැගින් |
| 03. ඩේලි නිවුස්/සන්ඩේ ඔබ්සවර් | 01 බැගින් |

02. මේ සම්බන්ධයෙන් වැයවන ගාස්තුවට අදාල මාසික බිල්පත් හා වවුචර්පත් ගෙවීම් නිර්දේශ කර ප්‍රධාන කාර්යාලයේ සිවිල් පාලන අංශයට ඉදිරිපත් කිරීමෙන් පසුව අදාල චෙක්පත ඔබ වෙත ලබා දීමට කටයුතු කරනු ලැබේ.

03. තවද 1998.08.14 දිනැති අංක 361 රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව මධ්‍යස්ථාන භාර නිලධාරීට හෝ කඳවුර භාර නිලධාරියාට පුවත්පත් මිල දී ගැනිම සඳහා වැය වන මුදලින් 10% ක අගයක් ගෙවා ලබාගත හැකි බවත් වැඩිදුරටත් දන්වා සිටිමි. ඒ අනුව මීට අදාල මුදල ඔබ විසින් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව නමින් බම්බලපිටිය ලංකා බැංකුවේ පවත්වා ගෙන යනු ලබන **අංක 7042755 දරන ගිණුමට බැරකොට** අදාල රිසිට් පත් අධ්‍යක්ෂ (මුදල්) වෙත එවිය යුතුය.

04. පුවත්පත් මිලදී ගැනීම නිලධාරීන් අතර මාරුවෙන් මාරුවටද සිදුකල හැකිය.

05. මෙම චක්‍රලේඛය ලද බව මා වෙත දන්වා එවිය යුතුය.

සරත් පී වීරශේඛර ආර්ඩබ්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී
රියර් අද්මිරාල්
අධ්‍යක්ෂ ජනරාල්
සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව

පිටපත් :-
01. අධ්‍යක්ෂ (මුදල්)
02. අධ්‍යක්ෂ (පුහුණු)
03. අභ්‍යන්තර විගණන
04. ස්ථානාධිපති (සැපයුම්)
} දැනගැනීම සඳහා

මගේ අංකය: CSD/03/03/14. චක්‍රලේඛ අංක - 9/2015(I)
සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව,
අංක 23, දුම්රියපොල පාර,
බම්බලපිටිය.
2015-11-12

අතිරේක අධ්‍යක්ෂ ජනරාල්,
සියලුම අධ්‍යක්ෂවරුන්/නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්/සහකාර අධ්‍යක්ෂවරුන්,
සියලුම අංශභාර නිළධාරීන්,
සියලුම බලකා අණදෙන නිලධාරීන්/පුහුණු කඳවුරුභාර අණදෙන නිලධාරීන්,
හා ව්‍යාපෘතිභාර නිලධාරීන් වෙත,

**<u>දෛනික/සති අන්ත පුවත්පත් මිලදීගැනීම.</u>**

උක්ත සමාංක සහිතව පුවත්පත් මිලදීගැනීම සම්බන්ධව මා විසින් නිකුත් කරන ලද අංක 9/2015 හා 2015/11/05 දිනැති චක්‍රලේඛයෙහි 05 ඡේදය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

05) "දෛනික/ සතිඅන්ත පුවත්පත් මිලදීගැනීම සම්බන්ධයෙන් 2009-10-26 දාතමින් නිකුත් කරන ලද අංක 2009/24 දරණ චක්‍රලේඛය මෙයින් අවලංගු කරන අතර මෙම චක්‍රලේඛය 2015-11-01 දින සිට ක්‍රියාත්මක වන බව මෙයින් දන්වනු ලැබේ."

චන්ද්‍රරත්න පල්ලේගම
අධ්‍යක්ෂ ජනරාල්.

48